**දඹුල්ල මහා නගර සභාව - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දඹුල්ල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ රු.52,000 ක් වැයකර ඉදිකල මහා නගර සභා නාම පුවරුව හා රු.1,700,000 ක කසළ කැබලි කිරීමේ යන්ත්‍රය ප්‍රාග්ධනිත කිරීමේදි අදාළ වත්කම් ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර කල යුතු වුවද, එම වටිනාකම සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වත්කම් භෞතිකව ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව තිබියදි දෝෂ සහගතව රු.904,195 ක යන්ත්‍ර හා උපකරණ ඒකක 30 ක් ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලද ප්‍රතිපාදන මත දිගම්පතහා කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය හා ඇවිදින මංතීරු සඳහා දැරූ පිරිවැය රු.21,531,365 ක් නිවැරදිව ඉඩම් හා ගොඩනැගිලි යටතේ ඉකුත් වර්ෂයේ ගිණුම් ගතකර තිබියදී, එය මාර්ග සංවර්ධනය ලෙස දක්වා දෝෂ සහගතව එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලින් ඉවත් කර තිබුණි. | මාර්ග සංවර්ධනයක් ලෙස සලකා ඉවත් කළ බව | පරිශ්‍රයේ අගය වැඩි වන ඉදිකිරීමක් බැවින් වත්කම්වලට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂයේ වූෂණ බවුසර් සේවාව ලබා දීම වෙනුවෙන් බාහිර ආයතනයකින් ලැබිය යුතු රු.66,400 ක ආදායමක් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.370,830 ක පාරිභෝගික භාණ්ඩ තොගය ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ත්‍රී රෝද රථ වාහන බිල් කළ අගය රු.211,925 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි කිරීමේ සහතික හා පරික්ෂණ ගාස්තු ආදායම රු.53,917 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ කඩ කුළි ගෙවීමේ ප්‍රමාද මත අයකල දඩ ගාස්තුව රු.115,884ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ සංචාරක මණ්ඩයේ ලියාපදිංචි හෝටල් වලින් අයකරන ව්‍යාපාර බදු ආදායම රු.908,298 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂයේ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර ඇති බව | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති හිඟ ව්‍යාපාර බදු රු.190,201 අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී කලින් ලද මාළු කඩ ටෙන්ඩර් ආදායම රු.600,900 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ මාළු කඩ ටෙන්ඩර් ආදායම රු.220,197 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවීම් අවසන් කල රු.773,310 ක ණය ශේෂ 03 ක් හා නිසි පරිදි අදාල කාර්යය ඉටු නොකිරීම මත ගෙවීම් කපා හරින ලද එකතු වටිනාකම රු.909,650 ක් වන ණය හිමි ශේෂ 12 ක් ණය හිමියන් යටතේ තවදුරටත් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ක) | 2021 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.98,285 ක උපදේශන ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි | පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ග) | 2020,2021 හා 2022 වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.34,438,024 ක මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි | ණය ගැතියන් යටතේ හදුනා ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර් ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කළ බව | -එම- |
| (ච) | ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය නොකර තොග ශේෂයත් සමාලෝචිත වර්ෂයේ තොග ශේෂයත් අතර වෙනස ඌණතා හා අතිරික්තතා සංචිත ගිණුමට ගැලපීම් කිරීම හේතුවෙන් ආදායම් වියදම් ගිණුමේ පෙන්වන සමස්ථ වියදම රු.4,838,924 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ජ) | ආදායම් වියදම් ගිණුමේ ඌණතාවය/අතිරික්තතය,ඌණතා හා අතිරික්තතා සංචිත ගිණුමට ගැලපිය යුතු වුවද,එලෙස කටයුතු නොකර පොදු ලෙජරයේ වූ වැටුප් හා වැය පාලන ගිණුමේත් ආදායම් ගිණුමේත් වටිනාකම් ඌණතා හා අතිරික්තතා සංචිත ගිණුමට සටහන් කිරීම හේතුවෙන් ආදායම් වියදම් ගිණුමේ දැක්වෙන අතිරික්තයත් උක්ත ඌණතා හා අතිරික්තතා සංචිත ගිණුමට කල ගැලපීම් අනුව ඇති වූ අතිරික්තයක් අතර රු.137,072 ක වෙනසක් ඇති වී තිබුණි.එම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුලනය වීම සම්බන්ධයෙන් ගැටළු පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | දිගම්පතහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ හා දඹුල්ල සම්පත් මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.3,362,550 කාබනික පොහොර තොග ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඩ) | දිගම්පතහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත දිරන කසළ බැහැර කිරීමේ ගාස්තු වශයෙන් අනුරාධපුර මහා නගර සභාවෙන් ලැබිය යුතු රු.883,875 ක හිඟ ආදායමක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබීමේ අවිනිශ්චිතභාවයක් ඇති බැවින් ගිණුම් ගත නොකළ බව | ගිණුම් ගත කර විධිමත්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.427,638 ක නොසැසඳීමක් පැවතුණි. | පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 03 ක එකතුව ඊට අදාල උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.4,126,090 ක නොසැසඳීමක් පැවතුණි. | අත්වැරදි මත සිදු වී ඇත. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.23,182,499 ක වත්කම් ශේෂ 04 ක්, එක් වගකීම් ශේෂයක් හා සමුච්චිත අරමුදලින් ලියාහල ශේෂ 02 කට අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී උප ලේඛන නිවැරදිව පවත්වා ගෙන යනු ලබන බව. | ගිණුම් ශේෂයන්ට අදාළ ලේඛණ, උප ලේඛන හා ලිපි ගොනු පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 1646 | මහ නගර සභාවෙහි වාහන 22 ක ධාවන සටහන් මාස 08 සිට වසර 04 දක්වා කාලයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | යාවත්කාලින කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අංක 2/2017 දරන 2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමණාකරන චක්‍රලේඛ | මහ නගර සභාවෙහි වාහන 14 ක් සභාවේ පරිහරණයට යොදවාගෙන වසර 01 සිට වසර 14 ක කාලයක් ගතවී තිබුණද, සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,694,541 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 6,000,278 ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 44,950,000 | 26,946,796 | 33,313,525 | 6,102,728 | 5,000,000 | 5,662,506 | 3,933,669 | 12,469,464 |
| (ii). කුලී | 14,784,220 | 1,413,987 | 20,458,260 | 16,471,247 | 9,566,400 | 8,510,240 | 5,947,612 | 35,515,520 |
| (iii). බලපත්‍ර ගාස්තු | 2,495,000 | 2,985,062 | 3,581,576 | 1,773,036 | 5,000,000 | 5,152,294 | 5,152,294 | 2,369,550 |
| (iv). උසාවි දඩ | 50,000 | 1,640,350 | 569,708 | 1,107,500 | 1,500,000 | 71,656 | 43,798 | 27,858 |
| (v). මුද්දර ගාස්තු | 40,000,000 | 46,114,724 | 19,021,722 | 32,554,085 | 10,000,000 | 11,068,800 | 9,741,700 | 5,461,083 |
| (vi). වෙනත් ආදායම් | 19,500,000 | 28,685,198 | 51,605,007 | 9,119,468 | 18,228,400 | 14,573,127 | 6,190,398 | 32,039,277 |
| එකතුව | 121,779,220 | 107,795,117 | 128,549,805 | 67,128,064 | 49,294,800 | 45,035,625 | 31,009,472 | 87,882,752 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| I. 1946 අංක 30 දරණ වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද ,2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව භාවිතා කර සමාලෝචිත වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | තක්සේරු සිදු කරන බව | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| II. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.4,562,374 ක හිඟ වරිපනම් ශේෂයක් පැවති අතර ඉන් රු.10,000 කට වැඩි හිඟ ශේෂ සහිත වරිපනම් ඒකක 72 කින් අයවිය යුතු රු.1,074,245 ක් විය. මහා නගර සභා ආඥා පනතේ 247 ආ (4) වගන්තිය අනුව කටයුතු කර අයකරගෙන නොතිබුණි | හිඟ ආදායම් අයකරගැනිමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකරගැනිමට කටයුතු කළ යුතුය |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.8,896,350 ක කඩ කුලී ආදායමක් හා රු.3,921,471 ක හිඟ කඩ කාමර ටෙන්ඩර් කුලී ආදායම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි | නීත්‍යානුකූලව කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇති බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| **(ඇ) බලපත්‍ර ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 03 කින් ව්‍යාපාර බදු රු.1,389,987 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූලව කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇති බව | හිඟ ආදායම් අයකර ගත යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ප්‍රාදේශිය සභාවෙන් මහා නගර සභාව වෙත භාරදි තිබුණු වාහන 03 ක් හා මහා නගර සභාව විසින් මිලදී ගෙන තිබුණු ට්‍රැක්ටර් ටේලර් 08 ක් හා සභාවට ලැබුණු මුලාශ්‍රය සොයාගත නොහැකි මෝටර් රථයක්ද, ඇතුලුව වාහන 12 ක් සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරිමේ දෙපාර්තුමේන්තුව නිකුත් කල ලියාපදිංචි සහතිකය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කරන බව | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අගෝස්තු 24 සිට 2023 ජනවාරි 17 දක්වා කාලය තුල සිදු වි තිබු වාහන අනතුරු 20 කින් වාහන අනතුරු 13 ක් සම්බන්ධයෙන් මුලික පරික්ෂණ සිදු කර තිබුණද,එම පරික්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාහන අනතුරු හා අලාභ 10 ක් සිදු වි වසර 02 සිට වසර 06 ක් දක්වා කාලයක් ගත වි තිබුණද, මු.රෙ 104 (4) අවසන් පරීක්ෂණ සිදු කර නොතිබුණි. වාහන අනතුරු 10 ක වාර්තා මු.රෙ 104 (4) පරීක්ෂණ වාර්තා නිමකර තිබුණද,එම වාර්තා විගණිත 2023 දෙසැම්බර් 31 දින දක්වාත්, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව | පරීක්ෂණ සිදු කර අලාභ අය කර ගැනීමටත් පරීක්ෂණ පිටපත් විගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | හිටපු නගරාධිපතිවරයාගේ කාර්යාලයට නිකුත් කර තිබුණු රු.295,705 ක භාණ්ඩ වර්ග 26 ක් ධුර කාලය අවසන් වු 2023 මාර්තු 19 දින හිටපු නගරාධිපතිවරයාගෙන් ආපසු බාර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මූලික පරීක්ෂණයක් සිදුකර ඇති බව | අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේදී රු.1,221,450 ක් වැය කර ඉදිකරන ලද දිගම්පතහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මාර්ග හා විදුලි ආලෝක පද්ධතිය සංචාරකයින් ආකර්ශනය කර සංචාරක ව්‍යාපාරයේ නිරතවීම අරමුණු කර ඉදිකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට විදුලි පහන් කනු 74 න් 42 ක් හානියට පත්වී තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දඹුල්ල මහා නගර සභාව විසින් රු.443,225 ක මුදලක් වැයකර 2021 වර්ෂයේ දි වරිපනම් බදු අයකිරිම සඳහා ස්ථාපිත කරන ලද පරිගනක මෘදුකාංග පද්ධතිය අරමුණු ගත කාර්ය සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | නව පරිගණක පද්ධතියක් මගින් කටයුතු ඉටු කරන බව | මෘදුකාංග පද්ධතිය භාවිතා නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ගම්උදා භූමියේ වූ පැරණි ආයුර්වේද ගොඩනැගිල්ල ලිඛිත ගිවිසුමකින් තොරව හා කුලී අය කිරිමකින් තොරව 2022 ඔක්තෝබර් 06 දින සිට බාහිර පාර්ශවයන් 02 කට ක්‍රීඩා කටයුතු සඳහා ලබාදී තිබූ අතර අදාළ පුද්ගලයින් විසින් මහා නගර සභාවේ අනුමැතියකින් තොරව රු.400,000 ක් පමණ වැයකර අළුත්වැඩියා සිදුකර තිබුණි. | ගිවිසුම් ගත කිරීමටත් කුලී මුදලක් අය කර ගැනීමට කටයුතු කරන බව | විධිමත් ක්‍රමවේදය මත දේපළ කුලියට දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 09 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර ඒ හේතුවෙන් රු.40,500 ක ආදායම් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව | පරිසර බලපත්‍ර නිකුත් කළ යුතුය. |

**3.3 වත්කම් කළමණාකරනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව පරිහරණය කරන ගොඩනැගිලි 10 ක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි | තක්සේරු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.82,280,986 ක වත්කම් ඒකක 18 ක හා වටිනාකම හඳුනාගෙන නොමැති වාහන 02 ක් වසර 01 සිට වසර 02 දක්වා කාලයක සිට නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී අරමුණුගත කාර්යයන්ට යොදා ගන්නා බව | වත්කම් උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 22 (1) වගන්තිය අනුව ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සභාවට පවරා ගන්නා ලද එකතුව රු.9.230,500 ක ඉඩම් 10 ක් අරමුණු ගත කාර්යයට යොදා නොගෙන වසර 02 සිට 11 දක්වා නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී අරමුණුගත කාර්යයන්ට යොදා ගන්නා බව | වත්කම් උපයෝජනය කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ස්ථිර කම්කරුවන් 11 ක් හා අනියම් කම්කරුවන් 03 ක් තනතුරට අදාළ රාජකාරි වල යොදවා ගැනිමකින් තොරව මාස 03 සිට වසර 06 දක්වා කාලයක සිට රියදුරු රාජකාරිවල සේවයේ යොදවා තිබුණි. | රියදුරන්ගේ පවතින පුරප්පාඩු මත වෙනත් සේවාවල නිලධාරීන් යොදවා ගැනීමට සිදු වූ බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගෙන නිලධාරීන්ගේ නිත්‍ය තනතුරේ රාජකාරි පැවරිය යුතුය. |
| (ආ) | මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලය,තත්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී තනතුරු 18 කට අදාළ නිලධාරීන් 64 කගේ පුරප්පාඩු පැවති අතර තනතුරු 03 කට අදාළව නිලධාරීන් 54 කගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉහළ නිලධාරීන්ගෙන් ඉල්ලීම් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (2017 අගෝස්තු 30 දිනැති අංක එල්.ඩී.බී.4/8/(XII) දරන සංශෝධනය අනුව කිසිදු තැනැත්තෙකු ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩදීම හෝ අවසරදීම සිදුනොකළ යුතු වුවද වෙන්කර නොගන්නා ලද කසළ හා රෝහල් වලින් හාරදී තිබූ සායනික කසළ දිගම්පතහා කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ විශාල වලකට දමා ගිනි තැබීම සිදුකර තිබුණි. | කසළ පිළිස්සීම වරදක් ලෙස පිළිගන්නා බව | නිසි ක්‍රමවේදමත කසළ බැහැර කළ යුතුය. |

**4.2** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව මහා නගර සභාව විසින් විධිමත් පරිදි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |